# විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
## (බාහිර) - 2008

## මානවශාස්ත්‍ර පීඨය

## නාට්‍ය හා රංග කලාව - DMAT -E1015

## රංග කලාවේ මූලිකාංග

**<u>ප්‍රශ්න පහකට (05)පමණක් පිළිතුරු සපයන්න</u>**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

01. "නාට්‍ය යනු ක්‍රියා අනුකරණයයි." මෙම නිර්වචනය නාට්‍ය කලාව හැඳින්වීමට ප්‍රමාණවත් යැයි ඔබ සිතන්නේ දැයි අදහස් දක්වන්න.

02. අභිචාර විධි ඇසුරින් රංග කලාවේ මූලිකාංග ප්‍රභවය වූ ආකාරය පැහැදිලි කරන්න.

03. නාට්‍ය කලාවේ ප්‍රභවය පිළිබඳ ග්‍රීක හා සංස්කෘත නාට්‍යකරුවන්ගේ මතය කෙබඳු දැයි විස්තර කරන්න.

04. අනෙකුත් කලා මාධ්‍යයන් හා සැසඳීමේ දී නාට්‍ය කලාවේ දක්නට ලැබෙන විශේෂතා පිළිබඳ විමසීමක් කරන්න.

05. නාට්‍ය යනු කුමක්දැයි පෙර'පර දෙදිග ප්‍රකට නිර්වචන සහ නිර්මාණ ඇසුරින් විමසීමක් කරන්න.

06. ශෝකාන්තයේ අංග පිළිබඳ විස්තර කරන්න.

07. "නාට්‍ය වූ කලී කතාවක් කියන්නට නොව රඟ දක්වා පෙන්වීමට නිර්මාණය කරන්නක්" යන ප්‍රකාශය නිදසුන් සපයමින් සනාථ කරන්න.

08. රූපණයේ විවිධ ප්‍රභේද හඳුන්වා දී ඒ එක් එක් ප්‍රභේදයන්හි රූපණ කාර්යයේ සිදුවන වෙනස්කම් පෙන්වා දෙන්න.

09. නාට්‍ය අධ්‍යක්ෂකවරයෙකු නාට්‍යයක් නිෂ්පාදනය කිරීමේ දී අනුගමනය කරන ක්‍රියා මාර්ග කෙබඳු දැයි පැහැදිලි කරන්න.

10. පහත සඳහන් <u>එක්</u> මාතෘකාවක් පිළිබඳ විග්‍රහයක් කරන්න.

    I. ස්වාභාවික නාට්‍ය සම්ප්‍රදාය
    II. විකාර රූපී නාට්‍ය සම්ප්‍රදාය
    III. වීදි නාට්‍ය සම්ප්‍රදාය
    IV. පාස්කු නාට්‍ය

**************************